1925 75 2000

පර්යේෂණ ක්ෂේත්‍රයේ 75 වසරක අභිමානය
75 வருட ஆய்வின் சாதனை
75 Years of Research Achievement

# තේ තතු

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA
UNITAS SALUS NOSTRA
INCORPORATED 1925

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි ISSN - 1391-6785

දෙවන කාණ්ඩය, දෙවන කලාපය 2002 ජූලි - දෙසැම්බර්

## දේශ ජනිත දැනුමෙන්....

### බිම් පැල සිටුවන්නේ නම්..

නව තේ වගාවක් ආරම්භ කරන විට එහි සිටුවීම සඳහා වඩාත් සුදුසු යැයි තේ පර්යේෂණායතනය නිර්දේශ කරනු ලබන්නේ නිර්දේශිත ප්‍රමාණයන්ගෙන් යුත් පොලිතීන් මළුවල සිටවූ රිකිළි තේ පැල ය. මේවා සිටුවීමෙන් නව වගාවේ වැඩි සාර්ථක පැල ප්‍රතිශතයක් ලැබෙන බව අපගේ පර්යේෂණ තුලින් ද සනාථ කර ඇත. එය එසේ නම්, සමහර ප්‍රදේශවල කුඩා තේ වතු හිමියන් පොලිතීන් මළුවල සකස් කළතේ පැල වෙනුවට තවාන් පාත්ති වල වවාගත් පැල (බිම් පැල) සිටුවීමට පෙලඹෙන්නේ ඇයි? මෙයට ආර්ථික, සාමාජයීය, හෝ වෙනත් හේතු කාරණා රැසක් තියෙන්නට පුළුවන. එම කරුණු සොයා බලා ඒවා ට සාර්ථක විසඳුම් සොයා දීම අපේ යුතුකමකි. එබැවින් ඒ දෙසට ද අපගේ ඉදිරි පර්යේෂණ කටයුතු යොමු වී ඇත.

එතෙක්, නොකර බැරි අවස්ථාවල මෙම බිම් පැල වඩාත් සාර්ථක ලෙස යොදාගත හැක්කේ කෙසේ දැ යි සොයාබැලීමට මා විසින් උත්සහයක් ගනු ලැබිණ. මෙහි දී මට අවබෝධ වූයේ බිම් පැල වල අසාර්ථකත්වයට වඩාත් ම හේතු වී ඇත්තේ තවානෙන් ගලවාගත් බිම් පැල තේ ඉඩමට ගෙනයාමේ දී සිදුවන හානි සහ හැකි ඉක්මනින් සහ වැරදි ලෙස එම පැල ක්ෂේත්‍රයේ සිටුවීමට ක්‍රියා නොකිරීම බවය.

එනිසා, මෙම හානි අවම වන ලෙස බිම් පැල ක්ෂේත්‍රයට ගෙන යා හැකි විවිධ ක්‍රම සොයා බලා එම ක්‍රම සංසන්දනාත්මක ව ඇගයීමක් කිරීම ට මවිසින් උත්සාහයක් ගනු ලැබිණ. මේවා අතරින් මා විසින් අධ්‍යයනය කරන ලද ප්‍රධාන ක්‍රම කිහිපයක් නම්:

1. ගලවා ගත් බිම් පැල මිටියක් ලෙස බැඳ ක්ෂේත්‍රයට ගෙන යාම .
2. ගලවා ගත් බිම් පැල පොලිතින් මල්ලක අසුරා, පොලිතින් මල්ල තුලට වතුර සවල්පයක් යොදා, මල්ලේ කට හොඳින් බැඳ ක්ෂේත්‍රයට ගෙනයාම .
3. පත්තර පිටුවක් මත ලී කුඩු, කසළ තේ හෝ කොහුබත් තුනී ස්තරයක් ලෙස අතුරා ඒ මත බිම් පැල තැබීමෙන් අනතුරුව හොඳින් ඔතා, පත්තර පිටුව ජලයෙන් තෙමා, ඒ පැල සියල්ල එකට බැඳ රැගෙන යාම .

මෙම ක්‍රම තුන අතරින් පළමු ක්‍රමයේ දී මුල් සහ පත්‍ර ඉක්මනින් වියළීමට භාජනය වන නිසා ක්ෂේත්‍රයේදී ඒවා අසාර්ථක වීමට ඇති ප්‍රවණතාව ඉහලය.

දෙවන ක්‍රමය පළමු ක්‍රමය තරම් හානිකර නොවුවත් වැඩිවේලාවක් මේ ආකාරයට පැල තබාගැනීමේ දී පැල තරමක හෝ තැම්බීමකට භාජනය වීම නිසා එම පැල ක්ෂේත්‍රයේ දී අසාර්ථකවීමට පුළුවන. තෙවන ක්‍රමයේදී මූල පද්ධතිය වියළී යාම වලක්වා ඇති අතර අධික තැම්බීමකට ද පැල භාජනය නොවන නිසා යහපත් ආකාරයකින් බිම් පැල ක්ෂේත්‍රයට ගෙන යා හැක.

මෙම ක්‍රම අතුරින් පළමු ක්‍රමය පිළිබඳ ඔබට අත්දැකීම් ඇති බව මම දනිමි. මා ලද අත්දැකීම් අනුව තෙවන ක්‍රමය වඩාත් හොඳින් භාවිතා කළහැකි බව මට අවබෝධ විය. යම්හෙයකින් ඔබට බිම් පැල සිටුවීමට සිදුවුවහොත් මෙම ක්‍රම අනුව බිම් පැල සිටුවා ඔබ ලබන අත්දැකීම් අප වෙත ලියා එවන්න. අවසන් වශයෙන් මා නැවතත් සඳහන් කරන්නේ හැකි සෑම අවස්ථාවකම මළුවල සිටුවූ තවාන් පැළ සිටුවීම සඳහා උත්සහ ගන්නා ලෙසය.

බී.ඒ.ඩී.සමන්සිරි